**ත්‍රිකුණාමලය නගර සභාව**

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 18 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 24 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 12 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ත්‍රිකුණාමලය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | නගර සභාවේ පොදු ගබඩාවේ ඇති ලිපිද්‍රව්‍ය, ජල සම්බන්ධතා ද්‍රව්‍ය, වැඩ කොටස් ද්‍රව්‍ය, වීථි ලාම්පු සවිකිරීම් සහ වාහන ඉන්ධන ඇතුළත්ව සමාලෝචිත වර්ෂ අවසානයේ තොගය රු.14,481,643ක පැවති නමුත්, ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල තොගය රු.2,395,798ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි තොගය ගිණුම්වල දැක්වීමට කටයුතු කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ ගබඩා තොගයෙන් වැරදීමකින් වාහන අළුත්වැඩියා වියදම් රු.මිලියන 1.5ක් ඇතුළත්ව තිබීම නිරීක්ෂණය විය. එමනිසා අදාල සේවා වටිනාකමින් ගබඩා තොගය වැඩිවී තිබුණි.භාණ්ඩ ප්‍රසම්පාදන ගෙවීම්වලදී පමණක් තොග ලෙස ගණන්ගැනීමේ පටිපාටියක් පවතී. අදාල අඩුපාඩු දැනට නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. |
| (ii) | ආයුර්වේද මධ්‍යස්ථානයේ ඖෂධ ද්‍රව්‍යවල තොගයේ වටිනාකම රු.223,098 ක් මූල්‍ය ප්‍රකාශනට ගෙනැවිත් නොතිබුණි. | ආයුර්වේද තොගය ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කළයුතුවේ. | අදාල ආයර්වේද බෙහෙත්, තොගයට එකතු කිරීමට ඉදිරියේදි කටයුතු කරනු ලැබේ. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානය දක්වාසභාවේ ධාවන තත්ත්වයේ පවතින | වාහනවල වටිනාකම් ගණනයකර මූල්‍ය | බහුතර වාහන සංඛ්‍යාවක් සභාවට පරිත්‍යාග කරන ලැබූ |

| | | | |
|---|---|---|---|
| | වාහන 52ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රකාශනවලහෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවේ. | අතර එම වාහනවල වටිනාකම් පරිත්‍යාගකරු විසින් සඳහන් නොකරන ලදි. එනමුත් මෙය ගිණුම්කරණ දෝෂයක් බව පිළිගන්නා අතර 2020 වර්ෂ අවසන් ගිණුම්වල මෙය නිවැරදි කරනු ලබන බව දන්වමි. |
| (iv) | සේවක ණය ලේඛනය අනුව, සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති හිඟ ණය ශේෂය රු.21,316,765 ක් වූ මූල්‍ය ප්‍රකාශනවල රු.20,578,220 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි තොගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවේ. | අදාල රු.729,545 අඛණ්ඩව 2010 වර්ෂයේ සිට අවසන් ගිණුම්වල ඉදිරිපත් කරමින් පැවතුණි. ණය ලබාගත් අය ස්ථාන මාරුවී යාමත්, විශ්‍රාම ගොස් හෝ මිය ගිය නිලධාරින්ව සිටීමත්, දැනට ඉහත වටිනාකම සමග සේවක ණය ඒක පුද්ගල ශේෂ සමාන කර සකස් කළ ලැයිස්තුව සබාවට ඉදිරිපත් කර අදාල වටිනාකම කපා හැරීමට හෝ අයකිරීමට සුදුසු අනුමැතිය ලබාගැනීමට මූලික කටයුතු සිදු කරමින් පවති. |
| (v) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු සඳහා ලැබූ පොළී රු.1,196,248 ක් ආදායම් වියදම් ගිණුමට ගෙනැවිත් නොතිබුණි. | ආදායම, ආදායම් වියදම් ගිණුමට ගෙන ඒමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදිස්ථාවර තැන්පතු සඳහා ලැබූ පොළී,ආදායම් වියදම් ගිණුමට ගෙන එනු ලැබේ. |
| (vi) | සභාව සතු ගොඩනැගිලි 39 ක් සහ ඉඩම් 05ක් සම්බන්ධයෙන් ඒවයේ වටිනාකම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම තක්සේරු කර ඉඩම් හා ගොඩනැගිලිවල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවේ. | අදාල වත්කම් නැවත තක්සේරු කිරීම් පිළිබඳව තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් වත්කම් තක්සේරු කිරීම් සිදු කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. එනමුත්, වර්තමානයේ තාවකාලික තක්සේරුවක් සිදු කිරීම සඳහා නිලධාරීන් දෙදෙනෙකු තාවකාලිකව අනුයුක්ත කර තක්සේරු කාර්යයන් ක්‍රියාත්මක කෙරේ. |
| (vii) | සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගණනය කළ හිඟ මුද්දර ගාස්තු රු. 18,662,906ක් ගිණුම්වල දක්වා තිබූ නමුත් නගර සභාවෙන් ලැබූ පොත්පත් අනුව සමාලෝචිත වර්ෂ අවසානය දක්වා ගණනය කළ හිඟ මුද්දර ගාස්තු රු.26,434,310ක් විය. මේ අනුව රු. 7,771,404ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් අප වෙත යවනු ලැබූ 2018 වර්ෂය සඳහා හිඟ විස්තර ඇතුළත් ලේඛනයේ රු. 26,434,310ක් ලෙස දක්වා තිබූ අතර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුව පරීක්ෂා කිරීමේදී විවිධ ක්‍රියාකාරකම් පදනම් කර ගනිමින් ඇතැම් වටිනාකම් ඉවත් කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| | | මේ නිසා ශුද්ධ මුද්දර ගාස්තු ප්‍රමාණය පළාත් භාණ්ඩාගාරයට තහවුරු කිරීමෙන් පසුව පමණක් අවසන් ගිණුම්වලට ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය අනුගමනය කෙරේ. |

**(ආ) ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විදුලිබල මණ්ඩල හාරදීම් රු.5,010,261ක් හා කාර්යයන් මත අයකළ යුතු හිඟ රු.108,005 ක් අඛණ්ඩව වර්ෂ 10කට අධික කාලයක සිට ගිණුම්වල ඉදිරිපත් කර තිබුණත්, ඒ සම්බන්ධ ලේඛන, පොත්පත් සහ තහවුරු කළ හැකි සාක්ෂි කිසිවක් නොතිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අවසන් ගිණුම්වල වර්ෂ 10කට අධික කාලයක් සිට ඉදිරිපත් කරන ලැබිය යුතු විදුලිබල මණ්ඩල හාරදීම් රු.5,010,261ක්, කාර්යයන් මත අයකළ යුතු හිඟ රු.108,005ක් සහ විවිධ හිඟ අයකිරීම් රු.2,132ක් ආදිය හඳුනා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් පලාත් පාලන මුල්‍යය විෂයෙහි නිපුණත්වයක් සහිත කමිටුවක් පත්කර එහි වාර්තාව අනුව සභාව විසින් ක්‍රියාමාර්ග ගැනිමට තීරණය කර ඇත. |

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.1**34,734,923** ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් සඳහා අදාල සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛනයේ අප සභාවට අයත් හිමිකම් සහිත ඉඩම් සහ ගොඩනැගිලි පමණක් ඇතුළත් කර ඇත. අනෙකුත් ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රාදේශිය සභාවට හාරදීම් පිළිබඳව ඉඩම් හිමිකම් තහවුරු කිරීමේ ලේඛන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යවා තිබු නමුත්, මෙම ඉඩම් සහ ගොඩනැගිලිවල හිමිකම් ඔප්පු ලැබී නොතිබුණි. |

**1.4** **අනුකූල නොවීම**

**---------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**------------------------------------------------------------------------**

| | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| | ----------------------- | ----------------------- | ------------ | -------------------- |
| (අ) | නගර සහා ආඥා පනතේ 177 (2) වගන්තිය (පරිශිෂ්ඨය 255) | මූල්‍ය ප්‍රකාශනයේ සාරාංශ සෑම මුදල් වර්ෂකම මාර්තු 01 දිනට හෝ ඊට ප්‍රථම ගැසට් පත්‍රයේපළ කළ යුතු වුවත්, පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සභාව විසින් ප්‍රසිද්ධ කර නොතිබුණි. | සාරාංශ සෑම මුදල් වර්ෂකම මාර්තු 01 දිනට හෝ ඊට ප්‍රථම ගැසට් පත්‍රයේ පළ කළ යුතු වේ. | ඉදිරි කාලයේදි ඉහත ක්‍රියාමාර්ග අනිවාර්යයෙන් අනුගමනය කිරීමට කටයුතු කෙරේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.2 සහ 6.3 වගන්ති | රජයේ නිවාස 05ක් රජයේ නිලධාරින් නොවන පුද්ගලයින්ගේ භාවිතය සඳහා සමාලෝචිත වර්ෂයේ ලබා දි තිබුණි. | සභාවේ නිවාස අළුත්වැඩියා කර ඒවා අදාල නිලධාරීන්ට ලබාදීමට කටයුතු කළ යුතුවේ. | නගර සභා කම්කරු නිවාස බාහිර පුද්ගලයිනට ලබාදී ඇත. මෙම නිවාස ශක්තිමත් ගොඩනැගිලි වශයෙනුත් අත්‍යාවශ්‍ය පහසුකම් (ජලය, විදුලිය සම්බන්ධතා, වැසිකිළි පහසුකම්) නොමැති නිවාස වේ.එනමුත් මෙම නිවාසවල පදිංචිව සිටින අයට ආපසු භාරදී ඉවත් වන ලෙසට ලිපි යවා ඇත. මෙම නිවාස දැනට කඩා ඉවත්කර නව මහල් නිවාස සංකීර්ණ ඉදිකිරීමට සභාව විසින් 2020.06.16 දින තීරණ ගෙන තිබුණි. තවද, නව අන්තෝනියාර් මාර්ගයේ පිහිටි රජයේ නිවාස ආණ්ඩුකාර memorandum මගින් පළාත් සභාවට කුලියට දි ඇති බව සඳහන් කරමි. |
| (ඇ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** <br> **----------------------** | | | |
| | (i) මුදල් රෙගුලාසි 571 | • වර්ෂ 03 සිට 06කට අධික රු.12,062,083ක් ලංසු, ගිවිසුම් තැන්පතු, පුස්තකාල තැන්පතු, විවිධ හා ජල | බදු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | බදුකරුවන් විසින් තැන්පත් කළ මුදල් විශාල වශයෙන් පොදු තැන්පත් ගිණුමේ පවති. තවදුරටත් එම කඩකාමර ඔවුන් විසින්ම බදු ගෙන මෙහෙයවන |

| | | | | |
|---|---|---|---|---|
| | | සම්බන්ධතා තැන්පතු මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවා නිරවුල් කිරීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | | නිසා එම මුදල් අඛණ්ඩව අප සතුව තැන්පතු ලෙසම තිබේ. ඒවා ආපසු ගෙවීමට/නිරවුල් කිරීමට කටයුතු කළ නොහැකිව පවතී. |
| (ii) | මුදල් රෙගුලාසි 371(3) | සභාවේ නිලධාරීන්ටත්, පුද්ගලික පාර්ශවයන්ටත් ලබාදුන් රු.608,584ක අත්තිකාරම් නිරවුල් කිරීමට හෝ ආපසු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් නිවැරදි ආකාරයෙන් නිරවුල් කිරිමට කටයුතු කළ යුතුවේ. | රු.608,584ක අත්තිකාරම් සම්බන්ධයෙන් කඩිනමින් නිරවුල් කිරිමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 චක්‍රලේඛයේ 02(iv) වගන්තිය | කාලය පදනමින් අමතර වේලාවක් සහ නිවාඩු දින දීමනා ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් තහවුරු කළ යුතු බව සඳහන් ව තිබුණත්, සභාවේ රාජකාරි කරන තාක්ෂණික නිලධාරීන් තිදෙනෙකුට ලබාදුන් රු.236,162ක දීමනා සඳහා ඇඟලි සලකුණු යන්ත්‍ර මගින් තහවුරු නොකර ගෙවීම් සිදු කරන ලදි. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුවේ. | ඒවන විටත් මධ්‍යම වැඩපළ (Yard) කොටසෙහි ඇඟිලි සලකුණු තැබිම හේතුවෙන් ඇති වූ ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතාවය නිසා ඔවුන් අදාල යන්ත්‍රය භාවිතා නොකිරීමට හේතුව වී තිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.89,963,948ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූආදායම රු.16,434,872ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම් රු.000" | 2019 බිල්කළ ආදායම් රු. 000" | 2019 රැස්කළ ආදායම් රු. 000" | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. 000" | 2018 ඇස්තමේන්තුගත ආදායම් රු. 000" | 2018 බිල්කළ ආදායම් රු. 000" | 2018 රැස්කළ ආදායම් රු. 000" | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. 000" |
|---|---|---|---|---|---|---|---|---|
| වරිපනම් බදු | 35,500 | 135,881 | 39,249 | 96,633 | 43,420 | 140,882 | 41,080 | 99,802 |
| කුලී | 31,800 | 48,180 | 19,018 | 29,162 | 30,707 | 48,097 | 21,129 | 26,968 |
| බලපත්‍ර ගාස්තු | 6,225 | 5,122 | 5,122 | -- | 5,275 | 5,175 | 5,175 | - |
| වෙනත් ආදායම් | 25,124 | 83,067 | 64,404 | 18,663 | 49,663 | 27,960 | 27,624 | 336 |
| එකතුව | 98,649 | 272,250 | 127,793 | 144,458 | 129,065 | 222,114 | 95,008 | 127,106 |

## 2.2.2 කඩ කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයේ හිඟ වරිපනම් බදු රු. 99,802,932ක් අයකිරිම සඳහා ආදායම් රැස්කිරීමේ නිලධාරීන් පත්කර තිබුණත් ඔවුන් විසින් රු.5,990,935ක් පමණක් අයකර ගෙන තිබුණි. | සුදුසු ක්‍රියාමාර්ගයන් මගින් හිඟ මුදල අයකිරිමට කටයුතු කළ යුතුවේ. | පිළිගෙන ඇත. රැස්කිරීමේ නිලධාරීන්ට වර්ෂය තුළ රැස් කළ යුතු හිඟ ප්‍රමාණය නිර්නය කර උපදෙස් ලිපි ලබාදීමට කටයුතු කර ඇත. තවදුරත් නිර්නය කළ හිඟ ප්‍රමාණය රැස්කිරිමට අපොහොසත් වන රැස්කිරීමේ නිලධාරීන්ට පත් වීම් අවලංගු කර නව රැස්කිරීමේ නිලධාරීන් පත්කිරීමට පියවර ගෙන ඇත. |
| (ආ) | අවම වශයෙන් වර්ෂ 05කට වරක් වරිපනම් බදු තක්සේරුවක් සිදු කර බදු අයකළ යුතුවේ. එනමුත්, 2009 වර්ෂයෙන් පසුව මේ දක්වා ප්‍රත්‍යාගණනයක් සිදු කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් කටයුතු කළ යුතුවේ. | දේපළ තක්සේරු පිළිබඳ තක්සේරු දෙපාර්තමේන්තුවට ඉල්ලීම් ලිපි යැවූ නමුත්, පිළිතුරු මේ දක්වා ලැබී නොතිබුණි. එනමුත්, ආසන්න වශයෙන් වූ තාවකාලික තක්සේරුවක් ලබා ගැනීමට සඳහා සභාවේ අනුමැතිය සමග නිලධාරීන් දෙදෙනෙකු තාවකාලිකව පත් කර නැවත ප්‍රත්‍යාගණනයක් සිදුකරනු ලැබේ. |

## 2.2.3 අනෙකුත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සංචාරක හෝටල් මත ආදායම් බදු<br>-----------------------------------------<br>නගර සභා බල ප්‍රදේශයේ 2017 සිට 2019 දක්වා කාල පරිච්ඡේදයේ අයකළ සංචාරක නිකේතන මත ආදායම් බදු පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය. | | |

| | | | |
|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනත යටතේ ලියාපදිංචි කළ එක් තානායමක්, ආපන ශාලා හෝ නවාතැන් ආදියෙන් බදු ලබාගැනීමට විගණන දිනය වන 2020 මැයි 05 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | බදු අයකිරීමට සුදුසු කටයුතු කළ යුතුවේ. | ඉදිරි කාලයේදි මෙය අයකිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | නගර සභා බල ප්‍රදේශයේ හෝටල් 03කින් 2017 සිට 2019 වර්ෂ අවසානය දක්වා කාල පරාසය වෙනුවෙන් බදු ගණනය කර සභාව විසින් අයකර නොතිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | මේ පිළිබඳව හෝටල් වෙත ලිඛිතව දන්වා ඇත. මෙම බදු අයකිරීම් සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂකවරුන්ට උලදෙස් ලබාදී ඇත.මේවා කඩිනමින් අයකිරීමට කටයුතු කෙරේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ හෝටල් 04ක අයිතිකරුවන්ගෙන් පසුගිය කාලයට අදාල හිඟ විධිමත්ව අයකර නොමැතිව වෙළෙඳ බලපත්‍ර සභාව විසින් නිකුත් කර තිබුණි. | හිඟ මුදල් අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | හෝටල් අයිතිකරුවන්ගෙන් හිඟ මුදල් අයකිරීමට කටයුතු කර ඇත. ඔවුන් සඳහා වෙළෙඳ බලපත්‍ර ව්‍යාපාර නියමිත බදු ගාස්තු ගෙවූ නිසා ලබාදී තිබුණි. ඉදිරියේදි ඔවුන්ගෙන් 1%ක් බදු අයකළ පසු වෙලෙද බලපත්‍ර නිකුත් කරනු ලැබේ. |

**2.2.4 උසාවි දඩ ගාස්තු සහ මුද්දර ගාස්තු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **උසාවි දඩ ගාස්තු**<br>සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුරු.10,036,458ක උසාවි දඩ ගාස්තු 2018 අගෝස්තු සිට 2019 ජූලි දක්වා කාලපරිච්ඡේදය සඳහා වේ. එනමුත්, සමාලෝචිත වර්ෂ අවසානය දක්වා වූ උසාවි දඩ මුදල් සම්පූර්ණයෙන්ම ලබාගැනීම සඳහා විගණන දිනය වන 2020 මැයි 06 දින වන විටත් සභාව විසින් කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් ලබාගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුවේ. | 2019 ජූලි දක්වා කාලපරිච්ඡේදයට අදාල උසාවි දඩ මුදල් අප විසින් සෘජුවම ගොස් ඉල්ලීම් කර ලබාගත් මුදල වේ. ඉතිරි හිඟ මුදලත් අයකිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | **මුද්දර ගාස්තු**<br>(i) නැගෙනහිර පළාත් සභාවේ 2010 වර්ෂයේ අංක 06 දරන මුද්දර ගාස්තු සංශෝධන පනතේ 3 වගන්තියට අනුව, වාර්ෂිකව මුද්දර ගාස්තු අයකළ යුතු වුවත්, 2018 ජනවාරි සිට 2019 | හිඟ මුදල් ලබාගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුවේ. | 2018 ජනවාරි දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාල මුද්දර ගාස්තු පිළිබඳ විස්තර රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන ඉල්ලීම් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) වෙත, |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31දින දක්වා කාලපරිච්ඡේදයට අදාල මුද්දර ගාස්තු නගර සභාව විසින් ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් නියමිත කාලය තුළ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | අප විසින් යවනු ලැබ ඇත. 2019 වර්ෂයට අදාල මුද්දර ගාස්තු පිළිබඳ විස්තර රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. මෙය කඩිනමින් ලබා ගැනීමවට කටයුතු කෙරේ. |
| (ii) | නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් 2016, 2017, 2018 සහ 2019 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයේ ඍජුව හා ජංගම සේවාවන් මගින් නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් දේපළ හිමියන් ගෙන් අයකළ අමතර මුද්දර ගාස්තු සභාව විසින් ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමතර මුද්දර ගාස්තු අයකිරීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | මෙම අමතර මුද්දර ගාස්තු ඉල්ලීම් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) වෙත, අප විසින් යවනු ලැබ ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය ප්‍රකාරව, ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කර තිබිය යුතුය. එසේ වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු අතුරු ව්‍යවස්ථාවක් ස්ථාපිත කර නොතිබුණි. | ඉතිරිව පවතින අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වේ. | අනුමත කළ අතුරු ව්‍යවස්ථා 03ක් ඇත. විෂයයන් 10ක් සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කර 2015 වර්ෂයේ ACLG, CLG මාර්ගයෙන් අමාත්‍ය ලේකම්වරයාට යවා ඇත. මේවා මේ දක්වා අනුමත කර අප වෙත ආපසු භාරදී නොමැත. ඉතිරි අතුරු ව්‍යවස්ථා කඩිනමින් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | නියමිත ආකෘතියේ සකස් කිරීමට කටයුතු කර ඇත. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **රජයේ නිවාස භාවිතය** | | |
| (i) 30දෙනෙකුට අධික නිලධාරි සංඛ්‍යාවක් ගෙවිය යුතු නිවාස කුලි රු. 324,250ක් වර්ෂ 10කට අධික කාලයක සිට හිඟ හිටව පැවැතුණු අතර ඒවා අදාල නිලධාරීන්ගෙන් අය කිරීමට හෝ එම නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමද සිදු කර නොතිබුණි. | සුදුසු කටයුතු කළ යුතුවේ. | රජයේ නිවාස මත කුලි සම්බන්ධයෙන් හිඟ ලැයිස්තුවේ සිටින අයට එරෙහිව නඩු පවරා ඇත. තවද, අදාල ලැයිස්තුවේ පවතින මියගිය නිලධාරීන් 2දෙනෙකු සම්බන්ධයෙන් සභාවේ තීරණය සහිතය කපා හැරීමට කටයුතු කරමින් පවති. |
| (ii) නගර සභාවේ නිලධාරීන් 08දෙනෙකු ගේ රජයේ නිවාස සහ වැඩ හා සෞඛ්‍ය කම්කරුවන් සඳහා රජයේ නිවාස කුලියට ලබාදී තිබු නමුත් සභාව විසින් කුලි ගිවිසුම් අත්සත් කර නොතිබුණි. | සුදුසු කටයුතු කළ යුතුවේ. | දැනට ලබාදෙන රජයේ නිවාස සඳහා ගිවිසුම් අත්සන් කරනු ලැබේ. එනමුත්, ගිවිසුම් අත්සන් නොකර පදිංචිව සිටින අය සඳහා පදිංචිව සිටි කාල පරිච්ඡේදයට අදාලව ලිපි ලබාගෙන ගිවිසුම් ඉදිරියේදි සිදුකරනු ලැබේ. |
| (iii) නගර සභාවේ රජයේ නිවාස 04ක් වර්ෂ 03කට අධික කාලයක සිට භාවිතා නොකර තිබුණි. | සුදුසු කටයුතු කළ යුතුවේ. | වැඩ කම්කරු රජයේ නිවාසයක් සහ සෞඛ්‍ය කම්කරුවන්ගේ නිවාසත් භාවිතා නොකර පවති. |
| (iv) රජයේ නිවාස කුලියට ලබාගැනීම සඳහා නගර සභාවේ සේවය කරන නිලධාරීන් 05 දෙනෙකුත් සෞඛ්‍ය කම්කරුවන් 06දෙනෙකුත් සහ වැඩ කම්කරුවන් 15දෙනෙකුත් අයදුම්කර තිබූ නමුත් වර්ෂ 05කට අධික කාලයක සිට රජයේ නිවාසවල පදිංචිව සිටින සේවකයින් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර අළුතින් අයදුම් කළ අයට නිවාස ලබාදීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | දැනට වර්ෂ 05කට වැඩියෙන් රජයේ නිවාසවල පදිංචිව සිටින සියළු දෙනාටම ඒවා හිස් කිරීමට උපදෙස් ලිපි ලබාදීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නගර සභාවේ සේවකයින්ගෙන් අයකළ සේවක අර්ථ සාධක අරමුදල් රු.19,969ක් සම්බන්ධයෙන් සේවකයින්ගේ ලේඛන සොයාගෙන ඒවා සේවක අර්ථසාථක අරමුදලට ගෙවීමට කටයුතු නොකර වර්ෂ 05කට අධික කාලය සිට ගිණුම්වල ඉදිරිපත් කරමින් පැවතුණි. | සුදුසු කටයුතු කළ යුතුවේ. | අදාල සේවක අර්ථ සාධක ශේෂ සම්බන්ධිත අය සොයා ගැනිමෙන් කටයුතු සිදුකරනු ලැබේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **තනතුරු පුරප්පාඩු සහ අතිරික්තයන්** | | |
| (i) | සභාවේ ලේකම් තනතුර ගණකාධිකාරි තනතුර පුරප්පාඩුව පැවැති නමුත් ඒ සඳහා නියමත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | 2017.02.28 දින සිට ලේකම් තනතුරේ පුරප්පාඩු පුරවා නොතිබුණි. පාර්ලිමේන්තු ගිණුම් සභාවේ උපදෙස් පරිදි මෙම පත්වීම සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතුවේ. මෙම පුරප්පාඩුව සම්බන්ධයෙන් ඒවන විටත් අදලා උසස් නලධාරීන්ට දැනුවත් කිරීම් සිදු කර ඇත. |
| (ii) | නගර සභාවේ අනුමත සේවක සංඛ්‍යාව අනුව සභාවේ වර්ග 18කට අයත් තනතුරුවල සේවක සංඛ්‍යාවෙන් වර්ග 11කට අයත් තනතුරු 37ක සේවක පුරප්පාඩු පැවතුණි. | සුදුසු පියවර ගත යුතුවේ. | සභාවේ පුරප්පාඩුව පවතින දිවයින පුරා සේවාවන් සහ සම්බන්ධිත සේවාවන් පිළිබඳව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් වරයාටත් සභාවෙන් පත්කිරිම් සිදු කළ හැකි අනෙකුත් පුරප්පාඩු පිළිබඳව ප්‍රධාන අමාත්‍යවරයාගේ ලේකම්වරයාටත් දැනුම් දී ඇත. එනමුත්, අතිරික්තව සිටින ගිනි නිවන භටයන් 04දෙනෙකු පමණක් පත්කර ඇති අතර වෙනත් කිසිදු සේවාවක අතිරික්ත පත්කිරීම් සිදු කර නොමැත. |
| (ආ) | **සේවක ණය**<br>1993 සිට 2000 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේ සේවය කළ | සුදුසු පියවර ගත යුතුවේ. | අදාල ණය මුදල් රු.729,545ක් දිර්ඝ කාලයක සිට අවසන් ගිණුම්වලත් ණය ලේඛනයත් |

| | | |
|---|---|---|
| සේවකයින්ගේ හිඟ ණය ශේෂ එකතුව රු.729,545ක් පැවැති නමුත්, මෙම ශේෂය කපා හැරීමට හෝ අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | | අතරත් නොසැසඳී තිබුණි. පළාත් පාලන කොමසාරිස්ගේ අනුග්‍රහය සමග පළාත් පාලන ආයතනවල ගිණුම් ක්‍රමවේදයේ නිපුණත්වයක් සහිත කමිටුවක් ස්ථාපිත කර මෙවැනි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**3.4.1 ඉඩම් විකුණුම් මත බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 165d උප වගන්තිය ප්‍රකාරව “නගර සභා බල ප්‍රදේශයක පිහිටි කිසියම් ඉඩමක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ වෙන්දේසි විකුණුම්කරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ නියෝජිතයා මගින් විකුණනු ලබන විට විකිණීම නැතහොත් ඔහුගේ සේවකයා නැතහොත් නියෝජිතයා එවැනි විකුණුම් මුදලෙන් 1%කට සමාන බද්දක් නගර සභාවට ගෙවිය යුතු වුවත්, ”2018 වර්ෂ කාලපරිච්ඡේදය සඳහා ඉඩම් විකිණීමෙන් ඉඩම් විකුණුම් මත 1%ක විකුණුම් බදු ලෙස රු. 5,653,900 ක් සහ 2019 වර්ෂය සඳහා ඉඩම් විකුණුම් බදුත් ගණනය කර අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සුදුසු පියවර ගත යුතුවේ. | මේ සම්බන්ධයෙන් නියළුම් නීතිඥවරුන් වෙත ලිපි යවා ඇත. එසේම, ඉඩමේ අයිතියමාරු කිරීමටඉදිරිපත් කිරීමේදි මෙම බදු ගෙවන ලද ඉඩම් සඳහා පමණක් අයිතිය පැවරීමට තීරණය කර තිබුණි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නිෂ්කාර්ය වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු වාහන 17 ක් වර්ෂ 01 සිට 10ක් දක්වා කාලයක් සභා පරිශ්‍රයේ නිෂ්කාර්යව පැවැති අතර ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණය කිරීමට හෝ භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | රෝහල්වලින් බැහැර කරන අපද්‍රව්‍ය පිළිස්සීමේ යන්ත්‍රය ස්ථාපිත කිරීමේ | ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීමෙන් පසුව | අදාල යන්ත්‍රය 2015 වර්ෂයේ ත්‍රිකුණාමලය |

| | | |
|---|---|---|
| කටයුතු රු.5,695,830 කින් 2015 වර්ෂයේදී ආරම්භ වී 2018 වර්ෂයේදී නිමකර තිබුණි. කෙසේ වෙතත්, මෙම පිළිස්සීමේ යන්ත්‍රය විගණිත දිනය වන 2020 මාර්තු 14 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | පමණක් මෙවැනි සැලැසුම් ආරම්භ කිරීමට පියවර ගත යුතුවේ. | රජයේ රෝහලේ අපද්‍රව්‍ය පිළිස්සීම සඳහා ස්ථාපිත කිරීමට තීරණය කරන ලද්දකි. එනමුත්, 2018 වර්ෂයේ අදාල කාර්යය සම්පූර්ණ කළ තත්ත්වයේ රෝහල් පරිශ්‍ර යේ වෙනත් අපද්‍රව්‍ය පිළිස්සීමේ යන්ත්‍රයක් ස්ථාපිත කර තිබූ නිසා සභාව විසින් පොදු සුසාන භූමිය ආශ්‍රිතව ස්ථාපිත කළ යන්ත්‍රය භාර ගැනීමට හෝ භාවිතා කිරීමට රෝහල ඉදිරිපත් නොවීය. |

## 4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදුවි නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු වේ. | අභ්‍යන්තර විගණන කටයුතු සඳහා අනුයුක්ත කළ නිලධාරියා ප්‍රසම්පාදන නිලධාරියෙකු ලෙස පත් කිරීම නිසා ඒ වෙනුවට වෙනත් නිලධාරියෙකු පත්කිරීමට පියවර ගෙන ඇත. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාවේ විගණන හා කළමනාකරණ කමිටු ආරම්භ කර කමිටු රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත කාර්තුවට අදාල රැස්වීම් නිවැරදි කාලයේ පැවැත්වීමට කටයුතු කර තිබුණි. |